" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 011 - 2093000


ISO 9001 · SLSI · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.09.30 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/8/6/19 හා 2021.09.23 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01 | 2021.07.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2021 | සේවාමුක්ත භටයෙකු පත් කිරීමේ දී අදාල කර ගත යුතු වැටුප තීරණය කිරීම |
| 02 | 2021.06.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2021 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් වලදී ජයග්‍රහණය කර එම ආයතන වල නගරාධිපති/සභාපති/නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති/නාගරික මන්ත්‍රීවරුන්/ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත්වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් වෙත ලබා දී ඇති රාජකාරි නිවාඩු සංශෝධනය |
| 03 | 2021.08.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(VII) | වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක:82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම |
| 04 | 2021.04.28 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2021 | පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම |

177

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

o/c
09/30

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2021

මගේ අංකය : EST 5/4/24(XXXIII)
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.07.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## සේවාමුක්ත භටයෙකු පත් කිරීමේ දී අදාළ කර ගත යුතු වැටුප තීරණය කිරීම

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 17:1(ඈ) උප වගන්තිය යටතේ සේවාමුක්ත භටයෙකුට දෙනු ලබන අනුග්‍රහ යටතේ, රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක රැකියාවක් ලබාදීමේ දී එම නිලධරයාගේ වැටුප තීරණය කිරීමේ දී ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අදාළ කරගත යුතු බව සඳහන් කර ඇති නමුත් එම නිලධරයන්ගේ වැටුප සකස් කළ යුතු ආකාරය සම්බන්ධව නිශ්චිත විධිවිධානයන් එම පරිච්ඡේදයේ හෝ ආයතන සංග්‍රහයේ වෙනත් පරිච්ඡේදයක් තුළ හෝ අන්තර්ගත වී නොමැත. එබැවින් සේවාමුක්ත භටයෙකුට රාජ්‍ය සේවයේ පත්වීමක් ලබාදීමේ දී පිහිටුවිය යුතු වැටුප් පියවර හා සම්බන්ධ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමටත්, අනතුරුව 8:9 ලෙස පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කිරීමටත්, 2020.10.12 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**"8. නැවත සේවයට ගැනීමේ දී, විකල්ප සේවා නියුක්තියේ දී, මුදා හැරීමේ දී හා සේවාමුක්ත භටයෙකු ලෙස බඳවා ගැනීමේ දී ගෙවන වැටුප**

**8:9 සේවාමුක්ත භටයෙකුට ලබාදෙන අනුග්‍රහ යටතේ රජයේ සේවයට හෝ සංස්ථා සේවයට බඳවා ගත් නිලධරයකුගේ වැටුප එම නිලධරයා විසින් සන්නද්ධ සේවයේ යෙදී සිටි කාලය තුළ දී උපයාගෙන තිබූ වැටුප මත පදනම්ව මෙම පරිච්ඡේදයේ 9 වගන්තියේ විධිවිධාන අනුව සකස් කළ යුතු ය."**

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය